# භික්ෂු බලය හා ලාංකික දේශපාලනය



ලංකා දේශපාලනය නිදහසට පෙර මෙන්ම නිදහසෙන් පසුවද වරින්වර ජාත්‍යන්තර කුමන්ත්‍රණකරුවන්ට හසුවීම නිසා ජාතික වශයෙන් අති විශාල පරිහානියකට පත්විය. උඩරට රදලවරුන් හා භික්ෂූන් භේදභින්නකර ඇති කළ කුමන්ත්‍රණවලට හසුවීමෙන් අපට කිරීටයේ බලය නැතිවිය. 1815 මාර්තු 2 දා සිට 1972 ජනරජ ව්‍යවස්ථාව එනතුරුම අප රට යුරෝපීය පාලන තන්ත්‍රයට නතුවී පැවතුණි.

අප රටේ දේශපාලන ඉතිහාසයේ ප්‍රබල සාධයක් වන භික්ෂූන්වහන්සේලා සක්‍රීයව දේශපාලන ක්‍රියාදාමයට පෙළඹෙන අයුරු දුටුගැමුණු රාජ්‍ය සමයේ සිට දක්නට ලැබෙයි. එහෙත් මාස ඇතුළු කීපදෙනෙකු හැර, අන් සියළු රජවරු භික්ෂූන් නොමහ හැරීම හා භේදභින්න කරමින් භික්ෂු බලය යටකරගෙන දේශපාලන බලයේ රැඳී සිටීමට උත්සාහ ගත් අයුරු දක්නට ලැබෙයි. වළගම්බා රාජ්‍ය සමයේ හා මහසෙන් සමයේ අනුරාධපුර මහාවිහාරය විශාල පරිහානියට පත්වීමත් අභයගිරි ජේතවන නිකායන් වර්ධනය වී ථෙරවාද බුද්ධ ධර්මය යටපත් වන්නට විය.

පෘතුගීසි ලන්දේශි යුගවලදී 16වන සියවසේදී 1 වන රාජසිංහ රජුගේ කුපිත වීමෙන් විහාරාරාම පමණක් නොව ප්‍රබල භික්ෂු චරිත පවා වැනසී යාමට හේතුවිය. විමලධර්මසූර්ය රාජ්‍ය සමයේදී රතනාලංකාර සංඝ රාජ හිමියන් ආරක්ෂාවීම නිසා දළදා වහන්සේත් ආරක්ෂාවූ අතර සෙංකඩගල මහනුවර රටේ අගනුවර බවටද පත්විය.

එහෙත් දෙවන රාජසිංහ රජුගෙන් පසුව රාජ්‍ය උරුමය පවත්වා ගැනීමට ශ්‍රීවික්‍රම රාජසිංහ දක්වාම එක ද රජකෙනෙකුටවත් දරුවෙකු නොලැබුණි. අන්තිම සිංහළ රජු වූයේ නරේන්ද්‍රසිංහයි. 1753 දී වැලිවිට මාහිමියෝ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ

**_ශාසනයට පැවරී තිබුණු වගකීම භික්ෂූන් වහන්සේලා පැහැර හැරීම නිසා ජෝන් ඩොයිලි වැනි විදේශීය ඔත්තු කරුවන්ගේ උපායශීලී කූට ගැටවලට හසුවීමෙන් ශාසනයත් ජාතියත් අවාසනාවන්ත ලෙස පරිහානියට පත්විය._**

උපකාරයෙන් ලන්දේශි නාවිකයන්ගේ උපකාරය මත සියම් දේශයෙන් උපසම්පදාව ලබාගෙන ශාසනය පුනරුත්ථාපනය කළද ජාතික වශයෙන් ශාසනයට පැවරී තිබුණු වගකීම භික්ෂූන් වහන්සේලා පැහැර හැරීම නිසා ජෝන් ඩොයිලි වැනි විදේශීය ඔත්තුකරුවන්ගේ උපායශීලී ගැටවලට හසුවීමෙන් ශාසනය පමණක් නොව ජාතියම අවාසනාවන්ත ලෙස පරිහානියට පත්වන්නට විය.

19 වන සියවස මුල් භාගයේදී හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, රත්මලානේ ධම්මාලෝක හිමි විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙණ් ඇතිකරලීම නිසා කතෝලික අධ්‍යාපනයත්, ඉංග්‍රීසි පාසැල් ක්‍රමයත් යටපත් කරගෙන සිංහළ බෞද්ධ අධ්‍යාපන ක්‍රමයක් ඇතිවිය. ඒ අනුව 1948 ජාතික නිදහස නාම මාත්‍රික ලෙස ලබාගත්තද, බෞද්ධ භික්ෂුව හා ජනසමාජය අතර විවිධ භේදභින්නවීම් සිදුවිය.

1948 න් පසුව අප රටට ඉතා අවාසනාවන්ත යුගයක් උදාකරමින් මතුව ආ ද්‍රවිඩ ජාතිවාදී බෂඹෑ ත්‍රස්තවාදී යුද්ධය මානුෂික මෙහෙයුමක් තුළින් ජයගන්නටත්, වසර 30 ක නොයෙක් දේශපාලන නායකත්වයන්ට පරාජය කිරීමට නොහැකි වූ කොටි ත්‍රස්තවාදී සංවිධානය සහ මුලින් අවසන් කරන්නටත් හැකිවිය.

**_ජනමූල නායකත්වයක් ඇතිවුණ මේ යුගයේ, භික්ෂු බලවේග කවර දිසාවකට ගමන් කළ යුතුද යන්න පිළිබඳව අපේ ගරු මහනායක හිමිවරු අවධානය යොමු කළ යුතුයයි සිතමි._**

කවර බාධක, සංවාද හා උපක්‍රම යෙදුනත් දෙවැනි වරටද මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට පත්වූවා පමණක් නොව සියළු ජනතාවන්ට අපේකම, දේශීය අභිමානය හා ජාතිකත්වය ඇති වූයේය. සිංහ කොඩිය ගුවනේ ලෙළ දෙද්දී කේක් කා, ජය පැන් බීම වෙනුවට කැවුම් කිරිබත් කන, යුද සෙබලා රණ විරුවෙක් බවට පත්කරගත් සමාජයක් ඇතිවුණි.

උතුර නැගෙණහිර සංවර්ධනය කර ඒකීය රටක් ලෙස ශ්‍රීලංකාව ගොඩනැගීමට ජාත්‍යන්තර වරායන් හැදී, කළු රන් ආකර බඳු තෙල් සම්පත ලබාගෙන, යුරෝපය වෙනුවට පෙරදිග රාජ්‍ය එකමුතුව ගොඩනගද්දී අමුතු අරගල ඇතිවෙයි. හිටිය හමුදා නායකයාත් විධායක බලතල හිමි සේනාධිනායකයාත් අතර ජනාධිපති තරඟ ඇතිවේ. හමුදා අධිකරණයට ඇති බලතල සිවිල් උසාවියක් ඉදිරිපිට විරෝධතා දැක්වීමෙන් අධිකරණයේ ස්වාධීනතාවට තර්ජන එල්ල වෙයි.

මෙතෙක් වෙන්ව සිටි සියම්, අමරපුර, රාමඤ්ඤ නිකායන්ට අයත් මහනාහිමිවරු ඒකාබද්ධවී විධායක ජනාධිපති තනතුරට අභියෝග ඉදිරිපත් වෙයි. මේවා පෙළගැසෙන්නේ කෙසේද? මෙබඳු විරෝධතා ඇතිවීමේ හේතුව කුමක්ද?

ආගමික නායකයන් හා රජය අතර ගැටීම් ඇතිවීමෙන් කවර ප්‍රතිඵලයක් අත්වේද? අතීතයේ අප රටටත්, මෑත කාලයේ ඉරාණය, ඉරාකය, බංලාදේශය, පකිස්ථානය හා බෞද්ධ පාලනයක් ගෙනයන බුරුමයේ හමුදා රජය හා භික්ෂූන්වහන්සේලා අතර ශෝචනීය ගැටුම් ඇතිවීම කෙරෙහි බලපෑම් කළේ කවුරුන්ද?

බෞද්ධ භික්ෂූන්ට ලැදි, බෞද්ධ සමාජයක් ඇතිකරවන, දේශීය ජනමූල නායකත්වයක් ඇතිවුණ මේ යුගයේ, ඇතිවන භික්ෂු බලවේග කවර දිසාවකට ගමන් කළ යුතුද යන්න පිළිබඳව අපේ මහනායක හිමිවරු අවධානය යොමු කළ යුතුවේ. මේ නිසාම හැමවිටම තුන්කල් බලා කටයුතු කිරීම වඩා උචිත නොවන්නේ ද?

**_එක්සත් රාජධානියේ තේම්ස් විහාරවාසී_**
**_රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති_**
**_පූජ්‍ය පන්නල සුමේධ ස්ථවිර_**



**_ආගමික නායකයන් හා රජය අතර ගැටීම් ඇතිවීමෙන් කවර ප්‍රතිඵලයක් අත්වේද? අතීතයේ අප රටටත්, මෑත කාලයේ ඉරාණය, ඉරාකය, බංලාදේශය, පකිස්ථානය හා බෞද්ධ පාලනයක් ගෙනයන බුරුමයේ හමුදා රජය හා භික්ෂූන්වහන්සේලා අතර ශෝචනීය ගැටුම් ඇතිවීම කෙරෙහි බලපෑම් කළේ කවුරුන්ද?_**

Duke's Court Travel
DUKE'S COURT TRAVEL Travel Management
Fly to Colombo
SriLankan Airlines fr £260 + Taxes + 10,000 Air Miles
Qatar Airways fr £289 + Taxes
Kuwait Airways fr £200 + Taxes
Emirates fr £410 + Taxes
Etihad Airways fr £294 + Taxes
Oman Air fr £163 + Taxes
Note: All fares mentioned are low season / terms & conditions apply.
020 8748 3535
3045 PROTECTED
AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS
IATA
204 King Street, London W6 0RA

ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න
Transfer Fees From only £5
FAST CASH
SEND TODAY - COLLECT TODAY
* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය
COMMERCIAL BANK
සම්පත් බැංකුව SampathBank
BOC BANK OF CEYLON
PEOPLE'S BANK
HNB
HSBC
Standard Chartered
Strong. Safe. Reliable. MCG Mike Cooke Group
www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT
